**අක්මීමන ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 25 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 04 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 23 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට අක්මීමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.22,326,091 ක් වූ ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.381,900 ක් වූ පරිගණක හා උපාංග යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ නොදක්වා ලී බඩු හා උපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සභා කාර්යාලය පවත්වාගෙන යනු ලබන ආයුර්වේද, පුස්තකාල හා ශ්‍රවණාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගත් රු.1,833,358 ක් වූ ණය මුදල මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල සභික දීමනාව රු.903,000 ක් වුවද, එයින් රු.521,250 ක් වූ යතුරුපැදි ණය වාරික අය කිරීම් අඩුකර රු.381,750 ක් පමණක් සභික දීමනා ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු.521,250 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) රු.439,798 ක් වූ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ වැඩ යෝජනා 09 ක් සහ සමාලෝචිත වර්ෂයේ වැඩ යෝජනා 18 ක් වෙනුවෙන් පිළිවෙලින් ගෙවිය යුතු වියදම් වූ රු.4,144,692 ක් හා රු.5,003,054 ක් ද වශයෙන් එකතුව රු.9,147,746 ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.4,144,692 කින් වැඩියෙන් ද සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම රු.5,003,054 කින් අඩුවෙන් ද ණයහිමියන් රු.9,147,746 කින් අඩුවෙන් ද දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබූ රු.2,313,313 ක ප්‍රාග්ධන ආධාර මුදල මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන ආධාර ලෙස නොදක්වා පොදු තැන්පත් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ මූලධන ආදායම් රු.2,313,313 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුලදී ඉටු කරනු ලැබූ කර්මාන්ත 08 ක වියදම රු.7,380,360 ක් වුවද, රු.738,035 ක් වූ 10% රඳවුම් ගාස්තු වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම රු.738,035 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.217,220 ක් වූ පුනරාවර්තන වියදම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් වියදම් රු.217,220 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.2,399,475 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.2,337,558 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.61,917 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල රු.2,831,960 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.3.4 නොසැසඳු පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව වූ ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව වූ ශේෂයන් අතර රු.6,294,253 ක වෙනසක් පැවතුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.79,442,686 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, තක්සේරු වාර්තා, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, උපලේඛන, විධිමත්ව පවත්වාගෙන යනු ලබන ණයගැති හා ණයහිමි ලේඛන, ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ, විධිමත්ව පවත්වාගෙන යනු ලබන අත්තිකාරම් ලේඛන සහ තැන්පත් ලේඛන ආදි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,617,686 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,825,908 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 වරිපනම් බදු හා අක්කර බදු**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව අයකර ගතයුතුව තිබූ රු.2,295,360 ක් වූ වරිපනම් බදු සහ රු.298,145 ක් වූ අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 වෙළඳ බලපත්‍ර ගාස්තු හා බදුකුලී**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව අයකර ගතයුතුව තිබූ රු.215,962 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු සහ රු.261,125 ක් වූ බදු කුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.2,905,102 ක උසාවි දඩ හා රු.23,428,280 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා නොදීම**

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව විගණන දිනය වූ 2014 ජනවාරි 27 දින වනවිට සභාපතිවරයා, උප සභාපතිවරයා සහ සභා මන්ත්‍රීවරුන් 11 දෙනෙකු සමාලෝචිත වර්ෂයට අදාල වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

**(ආ) උපදේශක කමිටු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ (2) වගන්ති අනුව මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය, කාර්මික සේවා සහ පරිසරය සහ පහසුකම් යන එක් එක් විෂයයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් දීම පිණිස වෙනම කාරක සභාවක් පත් කිරීම සහ සභාව විසින් සභාවේ බලතල හෝ කාර්යයන් කිසිවක් තීරණය කරනු ලැබිය හැකි

කොන්දේසිවලට යටත්ව කලින් කල එම කාරක සභා වෙත පවරනු ලැබීම කළයුතු අතර 2013 වර්ෂය සඳහා එම කමිටු පත්කර තිබුණ ද, ඒවා ක්‍රියාත්මක වී නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

(අ) සභාව සතු කැබ් රථය 2011 ජනවාරි 22 දින අනතුරට පත් වී තිබූ අතර, අළුත්වැඩියා කිරීම වෙනුවෙන් 2012 ජනවාරි මාසයේ රු.288,612 ක් ද, 2013 දෙසැම්බර් මාසයේ රු.360,461 ක් ද වශයෙන් එකතුව රු.649,073 ක් සභා අරමුදලින් එක්තරා ආයතනයක් වෙත ගෙවා තිබුණි. රියදුරු විසින් අනතුර සිදු වූවා යැයි වාර්තා කර ඇති ආකාරයට, එම ස්ථානයේ දී එවැනි අනතුරක් සිදු වී නොමැති බවත් වාහනයට සිදු වී ඇති අලාභ ද අනතුර හා අනුකූල නොවන බවත් දක්වා සංස්ථාව විසින් රක්ෂණ වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි.

**3.3 අවිධිමත් ගනුදෙනු**

---------------------

3.3.1 **ජල බවුසර් ටැංකි දෙකක් මිළදී ගැනීම**

------------------------------------------

සභාව සඳහා ජල බවුසර් ටැංකි දෙකක් මිළදී ගැනීමට 2012 අප්‍රේල් 10 දින පැවති මහා සභා රැස්වීමේ දී තීරණය කර මිළ ගණන් කැඳවා තිබුණි. ලැබී තිබූ මිළ ගණන් සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව රු.300,000 ක් වූ අවම මිළ ගණන් පිළිගැනීමට 2012 ජුනි 12 දින මහා සභාව අනුමැතිය ලබා දී තිබුණි.

සභාපතිවරයා 2012 ජුනි 25 දින අවම මිළ ගණන ඉදිරිපත් කර තිබූ ආයතනයේ කළමනාකරු වෙත ලිපියක් යවමින් ලබාගත් මිළ ගණන් අනුව එක් ජල බවුසරයක් සභාව වෙත ලබාදෙන ලෙසත්, එය ලබා දීමෙන් අනතුරුව චෙක් පතක් මගින් සම්පූර්ණ මුදල ගෙවීම් සිදුකල හැකි බවත් දන්වා තිබුණි.

සැපයුම්කරු විසින් 2012 ජුලි 30 දින ලීටර් 3200 පළමු ජල බවුසර ටැංකිය සභාව වෙත ප්‍රවාහනය කර දී තිබූ අතර, ඒ සඳහා 2012 ජුලි 30 දිනැති අංක 263 දරන බිල්පත ද සභාව වෙත භාර දී 2012 අගෝස්තු 27 දින රු.300,000 ක් ආයතනය වෙත ගෙවා තිබුණි.

ආයතනය විසින් 2013 මාර්තු 04 දින දෙවන ජල බවුසර ටැංකිය ද සභාව වෙත ප්‍රවාහනය කර භාර දී තිබූ අතර, ඒ සඳහා 2013 මාර්තු 04 දින රු.300,000 ක් වූ බිල්පත ද සභාව වෙත භාර දී තිබුණි. 2013 මැයි 14 දින 2013 මැයි 14 සභාවේ ගෙවීම් අනුමැතිය ලෙස වවුචරයේ සඳහන් කර ලීටර් 3200 ජල බවුසරයක් මිළදී ගැනීම සඳහා බිල්පත් පියවීම ලෙස දක්වා රු.300,000 ක් පෞද්ගලික ගමන් වවුචරයේ සඳහන් කර සභා අරමුදලින් ගෙවීම් සිදු කර තිබුණි. එකී වවුචරයට අමුණා තිබූ, ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ 2013 මාර්තු 04 දිනැති අංක 323 දරන බිල්පතෙහි සභාපතිවරයා විසින් සභා ලේකම් වෙත ලිඛිත සටහනක් යොදා, රේඛනය නොකර, නමට චෙක්පත නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස දක්වා තිබුණි. ගෙවීම් වවුචරයෙහි ගෙවීම් කරන ලද චෙක්පත් අංකය හා දිනය සටහන් කර නොතිබූ අතර ගෙවීම් මුදල් පොත හා චෙක් උපපත්‍රිකාව අනුව 2013 මැයි 14 දින අංක 416824 දරන චෙක්පත පෞද්ගලික අයෙකුගේ නමින් ලියා තිබූ බවත් එදිනම එම චෙක්පත මුදල් කරගෙන තිබූ බවත් අනාවරණය විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) සභාව වෙත ජල බවුසර ටැංකි දෙකක් මිළදී ගැනීම සම්බන්ධයෙන් වූ තොරතුරු ඇතුලත් ලිපි ගොනුවක් පවත්වා නොතිබුණි.

(ii) ආයතනය විසින් දෙවන ජල බවුසර ටැංකිය 2013 මාර්තු 04 දින සභාව වෙත ලබා දී, එදිනම රු.300,000 ක් වූ අංක 323 බිල්පත සභාව වෙත ඉදිරිපත් කර තිබුණ ද, චෙක්පත ආයතනය නමින් නිකුත් නොකර, පෞද්ගලික නමකට රේඛනය නොකරන ලද චෙක්පත නිකුත් කර තිබුණි. චෙක්පතෙහි පළමු අත්සන යොදා තිබූ කළමනාකරණ සහකාරවරයා (සැපයුම් නිලධාරී) විසින් එම චෙක්පත බැංකුව වෙත ඉදිරිපත් කර අක්‍රමිකව මුදල් කරගෙන තිබුණි.

### 3.3.2 විදුලි ජනන යන්ත්‍රයක් මිළදී ගැනීම

---------------------------------------

2013 අගෝස්තු 22 දින සභා අරමුදලින් රු.875,000 ක් වැයකර විදුලි ජනන යන්ත්‍රයක් මිළ දී ගෙන තිබුණි. පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 2013 අගෝස්තු 01 දින සභා ලේකම්වරයා විසින් කිලෝ වොට් 10 ශබ්ද රහිත ඩීසල් විදුලි ජනන යන්ත්‍රයක් සඳහා මිළ ගණන් ඉදිරිපත් කරන ලෙස ආයතන 03 ක් වෙත දන්වා තිබුණු අතර, රු.875,000 ක් වූ අඩුම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයට එය සපයන ලෙස 2013 අගෝස්තු 14 දින දන්වා තිබුණි.

(ආ) යන්ත්‍රය මිළදී ගැනීම සඳහා ඊට අදාළ පිරිවිතර සකස් කර නොතිබූ අතර ඉදිරිපත් කරන ලද මිළ ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙත යොමුකර නිර්දේශ ලබාගෙන නොතිබුණි.

(ඇ) විදුලි ජනන යන්ත්‍රය මිළදී ගත් ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ මිළ කියුමෙහි වගකීම් කාලසීමාවක් සඳහන් කර නොතිබුණ ද, ඒ සම්බන්ධව සභාවේ අවධානය යොමුකර නොතිබුණි.

(ඈ) විදුලි ජනන යන්ත්‍රය 2013 අගෝස්තු 30 සභාවට ලැබී තිබූ අතර ඊට පෙර අංක 1030 දරන වවුචරය මගින් 2013 අගෝස්තු 22 දින රේඛනය නොකළ රු.875,000 ක් වටිනා චෙක්පතක් සැපයුම්කරු නොවන එක්තරා පුද්ගලයකුගේ නමට ලියා තිබුණි. එම චෙක්පත ඔහු විසින් 2013 අගෝස්තු 23 දින බැංකුවෙන් මුදල් කරගෙන තිබුණි. 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 115 හා ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 137 හි විධිවිධානවලට පටහැනිව විදුලි ජනන යන්ත්‍රය සභාව වෙත ලැබීමට පෙර ඒ සඳහා ගෙවීම් කිරීමට කටයුතු කර තිබුණි.

(ඉ) විදුලි ජනන යන්ත්‍රය සමඟ සපයා ඇති මෙහෙයුම් සහ නඩත්තු පිළිබඳ අත්පොත පොදු අත් පොතක් පමණක් වූ අතර, එය මෙම විදුලි ජනන යන්ත්‍රයට අදාල නොවී ය.

(ඊ) සභාව සැපයුම්කරු සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබූ අතර වගකීම් කාලසීමාවක් සඳහන් නොමැති බැවින් හා ගිවිසුමකට එළඹ නොතිබීම නිසා මේ වනවිටත් සිදු කළයුතු අළුත්වැඩියාවන් පිළිබඳ අර්බුදකාරි තත්ත්වයක් උද්ගත වී තිබුණි.

(ඔ) 2013 අගෝස්තු 30 දින සභාවට ලැබී තිබුණු මෙම විදුලි ජනන යන්ත්‍රය 2014 අප්‍රේල් 09 දින දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලයේ විදුලි අධිකාරීවරයා, දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා සහ විගණන නිලධාරීන් විසින් ඒකාබද්ධව භෞතික පරීක්ෂාවට ලක් කරන ලදි. ඒ වනවිට විදුලි ජනන යන්ත්‍රය අක්‍රීයව පැවති අතර යාන්ත්‍රික ඉංජිනේරුවරයා සහ විදුලි අධිකාරීවරයා විසින් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කර තිබුණි.

(i) විදුලිජනන යන්ත්‍රයට අදාළ බැටරිය එහි නොතිබූ අතර, ප්‍රත්‍යාවර්තකයේ (Alternator) සිට විදුලිය එන රැහැන පිලිස්සී තිබුණි.

(ii) ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල සඳහා විදුලි ජනන යන්ත්‍රය සම්බන්ධ කිරීමක් කර නොතිබුණි.

(iii) විදුලි ජනන යන්ත්‍රයේ සඳහන් කර ඇති මාදිලිය, අනුක්‍රමික අංකය සහ අනෙකුත් විස්තර සැපයුම්කරු විසින් මිළ කියුමේ ඉදිරිපත් කර ඇති විස්තර සමඟ නොසැසඳුණි. ඕල්ටර්නේටර් මාදිලිය සහ අංක වෙනස් වූ අතර, ඕල්ටර්නේටරය ද මිළ කියුමේ සඳහන් නිෂ්පාදනයක් නොවී ය.

**4.** **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**---------------------------------------**

**පිළිතුරු නොදුන් විගණන විමසුම්**

**------------------------------------**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 12 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු. 4,341,057 ක් විය.

**5.** **පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) මූල්‍ය පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) වත්කම් කළමනාකරණය